(ආ) සමෘද්ධි අංශය විසින් නිකුත් කර තිබුණු වක්‍රීය ණය සම්බන්ධව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක 2024 වර්ෂය තුළදී, රු. 67,504,990 ක් වක්‍රීය ණය ලබා දී තිබුණු අතර මෙයින් 2024 දෙසැම්බර් 31 දිනට රු. 5,448,474 ක මුදලක් අය කර ගැනීමට පවතින අතර, අය කර ගත නොහැකි රු. 1,650,507 ක බොල් ණය ප්‍රමාණයක්ද පැවතුණි.

3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

අනු අංකය	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
	මු.රෙ 104(4)	උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සංචිත වාහනය 2024 අගෝස්තු 12 දින අනතුරට පත් වී සමාලෝචිත වර්ෂය අවසානයට මාස 05 ක් ගත වී තිබුණද, මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ආ)	රාජ්‍ය මුදල් චක්‍රලේඛ	
	2021 සැප්තැම්බර් 29 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2021 හි 23 (iv) ඡේදය	ප්‍රජා පාදක සමිතිවලට ලබා දුන් ව්‍යාපෘති උප කොන්ත්‍රාත් නොදිය යුතු බවට විධිවිධාන දක්වා තිබුණද, තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද රු. 4,288,650 ක් වූ ව්‍යාපෘති 05 ක් බාහිර පාර්ශවකයට උප කොන්ත්‍රාත් ලබා දී තිබුණි.
(ඇ)	ආයතනයේ කළමනාකරණ හා අභ්‍යන්තර නියෝගවලට අනුකූල නොවීම	
	2019 මැයි 03 දිනැති අංක KDS/1/8/1/37 දරන මහනුවර දිස්ත්‍රික් ලේකම්ගේ ලිපිය	ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක ග්‍රාම නිලධාරී කාර්යාල 211 ක් අධීක්ෂණ නිලධාරියෙකු විසින් පරීක්ෂාවට ලක් කර නොතිබුණි.

3.3 බදු අවශ්‍යතාවන්ට අනුකූල නොවීම්

2022 දෙසැම්බර් 22 දිනැති අංක එස්සීඊ/2022/ඊ/04 දරන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ අත්තිකාරම් පුද්ගල ආදායම් බදු පිළිබඳ උපදෙස් මාලාවේ 2 ඡේදය අනුව අත්තිකාරම් පුද්ගල ආදායම් බදු ගණනය කිරීමේදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක නිලධාරීන් 04 දෙනෙකුට ගෙවා තිබුණු එකතු වටිනාකම රු. 1,388,000 ක සමෘද්ධි රාජකාරී දීමනා, පළාත් සභා රාජකාරී දීමනා, සංවර්ධන ව්‍යාපෘති දීමනා හා රියදුරු දීමනාව සැලකිල්ලට ගෙන නොතිබුණි.

3.4 අවිධිමත් ගනුදෙනු

උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොරවිය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) කඳුකර දශකය දශවිධ විශේෂ ඒකාබද්ධතා ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය සඳහා රු. 9,970,200 ක් වටිනා වායු රයිෆල් හා පෙලට්ස් 174 ක් මිල දී ගෙන තිබුණි. 2024 ඔක්තෝබර් 11 දින අදාළ වායු රයිෆල් හා පෙලට්ස් ඇණවුම් කර තිබුණු අතර, වායු රයිෆල් 89 ක් 2024 දෙසැම්බර් 02 දින්ද 85 ක් 2025 ජනවාරි 16 දින ලැබී තිබුණි. එසේ වුවද, ආයතනය වෙත වායු රයිෆල් ලැබීමට පෙර 2024 ඔක්තෝබර් 30 දින යොදා වායුරයිෆල් 174 ම අදාළ පිරිවිතරවලට අනුකූල බව දක්වමින් තාක්ෂණික ඇගයීම් කමිටු සාමාජිකයන් ලෙස නිලධාරීන් 03 දෙනෙකු අත්සන් කර සියලු වායු රයිෆල් සපයා ගෙන නොතිබියදී 2024 දෙසැම්බර් 31 දින රු. 9,970,200 ක්වූ මුළු වටිනාකම සැපයුම්කරුට ගෙවීම්කර තිබුණි.

(ආ) අස්වැසුම ප්‍රතිලාභීන් පිළිබඳ පසුවිපරම් කටයුතු කිරීම වෙනුවෙන් උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වසම් 46 ක වාර්තා ලැබී නොතිබියදී ඒ සඳහා වූ රු. 392,000 ක දීමනා සඳහා වූ වෙක්පත් ලියා අත රඳවා ගෙන තිබුණි.

3.5 තැන්පතු

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 571 (2) ප්‍රකාරව කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක එකතුව රු. 519,068 ක කල් ඉකුත් වූ තැන්පතු ශේෂයන් 04 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.6 බැංකු ගිණුම් මෙහෙයවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මස බැංකු සැසඳුම් ප්‍රකාශනය අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 කට අදාළව එකතුව රු. 164,813 ක හඳුනා නොගත් ගෙවීම් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 කට අදාළව එකතුව රු. 3,486,454 ක හඳුනා නොගත් ලැබීම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක 2024 දෙසැම්බර් 31 දිනට වෙනත් පුද්ගලයන් හා ආයතන වෙත ගෙවීම් කිරීම සඳහා ලියනු ලැබූ එකතුව රු. 19,693,437 ක චෙක්පත් 196 ක් නිකුත් කිරීමෙන් තොරව අත රඳවාගෙන තිබුණි. මෙම චෙක්පත්වල වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට පිළියෙල කළ බැංකු සැසඳුම් ප්‍රකාශයේ නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් වශයෙන් සාවද්‍ය ලෙස දක්වා තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලැසුම් කිරීම

(අ) 2023 මැයි 23 දිනැති අංක HA/PLN/01/Action plan-2023-Vol-1 දරන රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන ලේකම්ගේ ලිපිය අනුව ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රගතිය අදියර අනුව සමාලෝචනය කළ යුතු බවද 2022 දෙසැම්බර් 21 දිනැති අංක KDS/3/10/02/01 දරන මහනුවර දිස්ත්‍රික් ලේකම්ගේ ලිපිය අනුව වර්ෂයට අදාළ ක්‍රියාත්මක සැලැස්මේ ප්‍රගතිය වර්ෂය අවසන් වී දින 10 ක් තුළ ඉදිරිපත් කළ යුතු බව දක්වා තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් අංශ 05 ක සිවිවන කාර්තුවේ ප්‍රගතිය 2025 අප්‍රේල් 05 දින වන විටත්, ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2024 ජනවාරි 24 දිනැති අංක PS/FID/ID/Circulars/1/2024 දරන ජනාධිපති ලේකම්ගේ චක්‍රලේඛ ප්‍රකාරව ග්‍රාමීය කමිටු යෝජනාවන් ලබා ගැනීමෙන් තොරව පූජාපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රු. 4,800,000 ක් වටිනා කර්මාන්ත ඉදිකිරීම් හා ද්‍රව්‍ය ආධාර ව්‍යාපෘති 19 ක් සමාලෝචිත වර්ෂය තුළ නිසි ක්‍රමවේදයෙන් බැහැරව මන්ත්‍රී විශේෂ බලපත්‍ර ක්‍රමය යටතේ ක්‍රියාවට නංවා තිබුණි.

4.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

(අ) කඳුකර දශකය 2024 – 2033 දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ දිළිඳු පවුල් සඳහා නිවාස පහසුකම් සැළසීමේ ව්‍යාපෘතිය යටතේ උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ දිළිඳු පවුල් 04 ක් සඳහා රු. 500,000 බැගින් රු. 2,000,000 ක නිවාස ආධාර ගෙවීමට ප්‍රතිලාභීන් සමඟ ගිවිසුම්ගත වී තිබුණද ප්‍රතිලාභීන් 04 දෙනා සඳහා ගෙවා තිබුණේ රු. 1,059,447 ක් පමණක් වූයෙන් එම ව්‍යාපෘතිය තුළින් අපේක්ෂිත අරමුණ ඉටු වී නොතිබුණි.

(ආ) වර්ෂ 2018 සිට වර්ෂ 2021 දෙසැම්බර් දක්වා වූ කාලය තුළ රු. 103,212,106 ක මුදලක් ගෙවා උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සඳහා නව ගොඩනැඟිල්ලක් ඉදිකර තිබුණි. එකී කොන්ත්‍රාත්කරු විසින් ගිවිසුම්ගත ඇස්තමේන්තු පිරිවිතරයන්ට අනුකූලව ගොඩනැඟිල්ල ඉදි නොකිරීම, ගොඩනැඟිල්ලේ ඉදිකිරීමේ දෝෂ විශාල ප්‍රමාණයක් පැවතීම, කොන්ක්‍රීට් වහලය නියමිත ප්‍රමිතියෙන් තොරව ඉදිකිරීම හේතුවෙන් ජලය ගොඩනැඟිල්ල තුළට කාන්දු වීම ආදී අඩුපාඩු සැකසීම සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 2,750,692 ක මුදලක් වැය කර නැවත පිළිසකර කිරීමට සිදු වී තිබුණි.

(ඇ) නියමිත පරිදි පස් පිරවීම් කර නොතිබියදී තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද පැති බැමි ඉදි කිරීමේ ව්‍යාපෘති 03 ක පස් පිරවීමේ කටයුතු වෙනුවෙන් පස් ඝනමීටර් 61.27 ක ප්‍රමාණයක් සඳහා රු. 165,596 ක මුදලක් ගෙවා තිබුණි.

(ඈ) ඉංජිනේරු සැළසුම් සකස් කිරීමේදී ඇති වුණු දුර්වලතාවයක් හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 29,586,375 ක වියදමක් දරා ඉදිකර ඇති වළල ඒ රත්නායක විදුහලේ රැඳවුම් බැම්ම ඉදිකර මාස 2 ක් තුළ ඇලවී ගොස් තිබුණු අතර ව්‍යුහාත්මක සහ භූ විද්‍යා විශේෂඥ උපදෙස් අනුව බැම්ම යථා තත්ත්වයට පත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග 2025 අප්‍රේල් 05 දින දක්වාම ගෙන නොතිබුණු අතර බැම්මේ පැවැත්ම අවිනිශ්චිත විය.

(ඉ) කැටවල හන්දියේ සිට නැඟිනිවෙල මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් රු. 23,724,000 ක මුදලකට කොන්ත්‍රාත්කරු සමඟ ගිවිසුම්ගත වී ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 20,689,384 ක මුදලක් ගෙවා තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාර්ග තලය මීටර් 1500 දිගට, මීටර් 5.5 පළලට සහ මාර්ග දෙපස උරහිස් මීටර් 0.5 ක් පළලින් සකස් කිරීම සඳහා ගිවිසුම්ගත වී තිබුණද, මාර්ගය ඉදිකර තිබුණේ, මීටර් 850 පමණක් බැවින් අපේක්ෂිත ප්‍රමාණයෙන් සියයට 43 ක් ඉටු කර නොතිබුණි. මාර්ගයේ දිග මීටර් 920 ක් ඉදිකළ බවට බිල්පත් සකස් කර ගෙවීම් කර තිබුණි. ඒ අනුව මාර්ග තලයේ ඉටු නොකළ මීටර් 70 ක කොටස් සඳහා වැඩ විෂය අංක 4.3 හා 4.4 යටතේ ඇස්ෆල්ට් ඇතිරීම වෙනුවෙන් මුළු මාර්ග තලය සඳහා ඇස්ෆල්ට් මෙට්‍රික් ටොන් 850 ක් ඇස්තමේන්තු කර රු. 1,540,760 ක්ද වැඩිපුර ගෙවා තිබුණි. කොන්ත්‍රාත්කරු වෙත ඇස්ෆල්ට් සැපයූ සමාගමෙන් ලබා ගත් තහවුරු කිරීම් අනුව ඇස්ෆල්ට් මෙට්‍රික් ටොන් 844 ක ප්‍රමාණයක් පමණක් කොන්ත්‍රාත්කරු වෙත නිකුත් කර තිබුණි. නමුත් මෙට්‍රික් ටොන් 900 ක් වෙනුවෙන් ගෙවීම් කිරීම හේතුවෙන් මෙට්‍රික් ටොන් 56 ක් සඳහා රු. 1,260,000 ක් වැඩිපුර ගෙවා තිබුණි.

(ii) මුළු මාර්ග තලයට ABC ඇතිරීම සඳහා ඝන මීටර් 100 ක ප්‍රමාණයක් ඇස්තමේන්තු කර තිබුණද, මාර්ගයෙන් සියයට 43 ක ප්‍රමාණයක් ඉදිකර නොතිබියදී මුළු මාර්ග තලය සඳහාම ABC ඝන මීටර් 290 ක් සඳහා රු. 1,885,000 ක මුදලක් ගෙවා තිබුණි.

(iii) ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 05 අනුව මීටර් 135 ක් දිගට කාණුවක් ඉදිකිරීම වෙනුවෙන් රු. 877,500 කට හා වැඩ විෂයය අංක 13 අනුව මාර්ගයේ දෙපස උරහිස් සකස් කිරීම සඳහා කොන්ක්‍රීට් ඝන මීටර් 30 ක් වෙනුවෙන් රු. 90,000 කට ගිවිසුම්ගත වී තිබුණද, එම වැඩ විෂයයන් ඉටු කර නොතිබුණි.

(iv) මාර්ගයේ උරහිස් හා කාණු ඉදි නොකිරීමට විධිමත් අනුමැතියක් ලබා නොගැනීම ගිවිසුම් මාර්ගයෙන් කොටසක් පමණක් ඉදිකිරීමට, විධිමත් අනුමැතියක් ලබා මාර්ග ඉදිකිරීම සම්මත පිරිවිතරයන්හි 506.3 අනුව ඇස්ෆල්ට් මිශ්‍රණ සැලැස්ම කොන්ත්‍රාත්කරු වෙත ලබා නොදීම, ඇස්ෆල්ට් අතුරන මාර්ග තලය සෑම මීටර් 05 ක පරතරයකින් යුතුව මැනුම් නොකිරීම, 506.4 පිරිවිතර අනුව මාර්ගයේ ඇස්ෆල්ට් ඇතිරීමට පෙර වැඩ බිමට ගෙනෙන ඇස්ෆල්ට් වල උෂ්ණත්වය පරීක්ෂා නොකිරීම වැනි අඩුපාඩු කර්මාන්තයේ පැවතුණි.

(ඊ) තලපියන්නාව ගුඩ්හොප් මාවත ඇස්ෆල්ට් අතුරා සංවර්ධනය කිරීම වෙනුවෙන් රු. 17,479,435 ක මුදලකට කොන්ත්‍රාත්තරුවෙකු සමඟ ගිවිසුම්ගත වී ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 12,556,150 ක මුදලක් ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මාර්ග තලය මීටර් 1600 ක් දිගට, මීටර් 3.25 ක් පළලට සහ මාර්ග දෙපස උරහිස් මීටර් 0.3 ක් පමණ පළලට සකස් කිරීම සඳහා ගිවිසුම්ගත වී තිබුණද, මාර්ගයෙන් සියයට 70 ක ප්‍රමාණයක් ඉදිකර නොතිබුණු අතර මීටර් 480 ක් පමණ ඉදිකර තිබුණි. ඇස්තමේන්තු වැඩ විෂයය අංක 4.1 අනුව මාර්ගයේ උරහිස් මීටර් 0.3 ක පළලින් සකස් කිරීම වෙනුවෙන් රු. 630,000 කට හා වැඩ විෂයය අංක 06 හා 07 යටතේ කාණු හා පැති බැම්ම ඉදිකිරීම වෙනුවෙන් රු. 1,462,384 කට ගිවිසුම්ගත වී තිබුණද, එම වැඩ විෂයයන් ඉටු කර නොතිබුණි.

(ii) මුළු මාර්ග තලය සඳහා ABC යෙදීමට ඝන මීටර් 100 කට ඇස්තමේන්තු කර ගිවිසුම්ගත වී තිබුණු අතර, මාර්ගයෙන් සියයට 30 ක් ඉදිකිරීම වෙනුවෙන් ඝන මීටර් 375 කට රු. 2,700,000 ක මුදලක් ගෙවා තිබුණි. එය ගිවිසුම්ගත ABC ප්‍රමාණය සියයට 1150 කින් ඉක්මවා යෑමකි.

(iii) මාර්ගයේ උරහිස් හා කාණු ඉදි නොකිරීමට විධිමත් අනුමැතියක් ලබා නොගැනීම ගිවිසුම්ගත මාර්ගයේ දිගින් කොටසක් පමණක් ඉදිකිරීම, මාර්ග ඉදිකිරීම් සම්බන්ධ සම්මත පිරිවිතරයන්හි 506.3 අනුව ඇස්ෆල්ට් මිශ්‍රණ සැලැස්ම කොන්ත්‍රාත්කරු වෙත ඉදිරිපත් නොකිරීම, ඇස්ෆල්ට් අතුරන මාර්ග තලය මීටර් 05 ක පරතරයකින් මැනුම් නොකිරීම, 506.4 අනුව වැඩ බිමට ගෙන එන ඇස්ෆල්ට්වල උෂ්ණත්වය පරීක්ෂා නොකිරීම වැනි අඩුපාඩු කර්මාන්තයේ පැවතුණි.

4.1.3 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

(අ) කඳුකර දශකය 2024-2023 දශවිධ විශේෂ ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ගඟවට කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කිරිමැටිය මැද පාරේ කාණු පද්ධතිය පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා හා කිරිමැටිය මැද පාරේ අතුරු මාර්ගයේ කාණු පද්ධතිය පුළුල් කර සංවර්ධනය කිරීම සඳහා පිළිවෙලින් රු. 500,000 ක් හා රු. 1,000,000 ක්ද, කිරිමැටිය මැද පාරේ ඇළ මාර්ගයේ බොක්කුව ඉවත් කර එම ස්ථානයට කුඩා පාලමක් ඉදිකිරීම සඳහා රු. 3,000,000 ක්ද, වශයෙන් එකතුව රු. 4,500,000 ක ප්‍රතිපාදන වැය කර තිබුණි. බහුතර මහජන අවශ්‍යතාවය පිළිබඳ සැලකිල්ලකින් තොරව, එක් පුද්ගලයෙකුට සිදුවන හානිය අවම කිරීම සඳහා සහ ප්‍රමුඛතාවය දිය යුතු කාරණා තිබියදී ඒ පිළිබඳ සලකා බැලීමකින් තොරව මෙම ව්‍යාපෘති තුන ක්‍රියාත්මක කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. කිරිමැටිය මැද පාරේ සහ අතුරු මාර්ගයේ කාණු පද්ධතිය ඉදිකිරීම සඳහා රු. 1,500,000 ක් වැය කර තිබුණද, "U" හැඩයේ කාණු වෙනුවට "L" හැඩයේ කාණු පද්ධතියක් ඉදිකිරීම හේතුවෙන් මාර්ගය දෙසට ජලය පිටාර ගැලීම සිදු වී තිබුණි.

ii. කිරිමැටිය මැද පාරේ ඇළ මාර්ගය රු. 1,000,000 වැය කර 2010 වර්ෂයේදී ඉදිකරන ලද ඉතා හොඳ තත්ත්වයේ පැවති බොක්කුව අවශ්‍යතාවයක් නොමැතිව කඩා ඉවත් කර තිබුණි.

(ආ) 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා පවුල් ලක්ෂ 02 ක් සවිබල ගැන්වීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක පවුල් 4,741 ක් සඳහා ප්‍රතිලාභ ලබා දී තිබුණද, 2024 දෙසැම්බර් 31 දින වන විට එම වැඩ සටහනට අදාළව අක්‍රීය ප්‍රතිලාභීන් ගණන 542 ක් හෙවත් සියයට 11 ක් විය.

(ඇ) සෞභාග්‍යා නිෂ්පාදන වැඩසටහන යටතේ 2021 හ 2022 වර්ෂවලදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ප්‍රතිලාභීන් 34 දෙනෙකු සඳහා ලබා දෙන ලද එකතුව රු. 1,657,312 ක වර්ග 30 ක උපකරණ 166 ක්ද, එක් ගමකට එක් ව්‍යවසායකයෙකු බිහි කිරීමේ වැඩසටහන යටතේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ප්‍රතිලාභීන් 08 දෙනෙකු සඳහා ලබා දෙන ලද රු. 937,044 ක වර්ග 09 ක උපකරණ 25 ක් නිෂ්කාර්යව පැවතුණි.

4.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත රු. 672,340,482 ක ව්‍යාපෘති 1,388 න් ක්‍රියාත්මක කර තිබුණේ, රු. 579,977,197 ක් වටිනා ව්‍යාපෘති 1,215 ක් පමණි. විවිධ ව්‍යාපෘති යටතේ ප්‍රතිපාදන වෙන් වූ රු.92,363,345 ක ව්‍යාපෘති 173 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) තුම්පනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මීගහහේන විද්‍යාලයේ ක්‍රීඩාපිටියේ නැරඹුම් මැදිරියක් ඉදිකිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. 972,000 ක මුදලක් වැය කර ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් නිම කර නොතිබුණි.

(ඇ) පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් ශ්‍රියාගම, වසමේ අලිමාන තෘණ මඟින් පරිසර හිතකාමී කඩදාසි නිෂ්පාදන ව්‍යාපෘතියට අදාළව කඩදාසි එකතු කිරීමේ, ගබඩා කිරීමේ හා බෙදා හැරීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා රු. 5,814,890 ක වටිනාකමකට ගිවිසුම්ගත වී තිබුණද, ඇස්තමේන්තුවේ වැඩ විෂයය අංක 11 සිට 49 දක්වා වූ රු. 3,800,560 ක් වටිනා වැඩ විෂයයන් 39 ක් සම්පූර්ණයෙන් ඉදිකිරීම් නිම කිරීමට අපොහොසත් වී තිබුණි.

4.1.5 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

(අ) මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් තැන්නලන්ද වසමට ප්‍රජා ජල ව්‍යාපෘතියක් ඉදිකිරීම වෙනුවෙන් ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැරව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට පවරා සමාලෝචිත වර්ෂය තුළ රු. 19,885,000 ක් වූ සම්පූර්ණ මුදල ගෙවා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1 මාර්ගෝපදේශයේ නියමයන්ගෙන් බැහැරව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය අනුගමනය කර තිබුණු අතර, 5.4.6 මාර්ගෝපදේශය අනුව සෑම ගෙවීමකදීම යම් නිශ්චිත මුදලක් රැඳවුම් ලෙස රඳවාගෙන නොතිබුණි. 5.4.8 මාර්ගෝපදේශය අනුව ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 5 කට නොඅඩු කාර්යසාධන සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණු අතර, 8.14 මාර්ගෝපදේශය අනුව කොන්ත්‍රාත් කාලය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.

(ii) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු 2024 ජූලි 31 දින වන විට නිම කළ යුතු වුවද, විගණිත දින වූ 2025 මාර්තු 21 දින වන විටද ව්‍යාපෘතිය නිම කර නොතිබුණු අතර, රු. 2,268,054 ක්වූ නළ ළිං දෙකක් පමණක් ඉදිකර තිබුණි.

(iii) 2024 දෙසැම්බර් 31 දින රු. 17,407,664 ක අවසන් ගෙවීම ගණකාධිකාරී විසින් සහතික කර නොතිබුණු අතර, කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කිරීමකින්, බිල්පත්‍රයක් ඉදිරිපත් කිරීමකින් හෝ ගිවිසුමකට එළඹීමකින් තොරව රු. 19,885,000 ක සම්පූර්ණ මුදලට ජාතික ජල සම්පාදන මණ්ඩලයට ගෙවා තිබුණි.

(ආ) මැදදුම්බර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ආදාහනාගාරයක් ඉදිකිරීම සඳහා 2017 අගෝස්තු 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අංක අමත/17/1578/716/03 මත පදනම්ව රු. 29,775,000 ක මුදලකට ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙත ප්‍රසම්පාදන පටිපාටියෙන් බැහැරව සැලසුම් කිරීම සහ ඉදිකිරීම සඳහා ලබා දී තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.12 මාර්ගෝපදේශය අනුව තරඟකාරීත්වයට හසු නොකොට, මේ සඳහා හැකියාවක් සහ සම්පත් පවතින කොන්ත්‍රාත්කරුවන් සිටියදී 2017 ලබා දුන් අමාත්‍ය මණ්ඩල තීරණය මත පදනම්ව ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ සහ සංවර්ධන මධ්‍යස්ථානය වෙත කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි. 8.14 මාර්ගෝපදේශය අනුව 2024 දෙසැම්බර් 31 දින වන විට කොන්ත්‍රාත් කාලය අවසන් වී තිබුණද, විගණන දින දක්වාම කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර නොතිබුණි. 5.4.4 මාර්ගෝපදේශය අනුව රු. 6,000,000 ක අත්තිකාරම් මුදලක් ගෙවීම් කර තිබුණද, ඒ සඳහා අත්තිකාරම් සුරක්ෂණයක් ලබා ගෙන නොතිබුණි. 5.4.6 මාර්ගෝපදේශය අනුව වැඩ සඳහා වූ සෑම ගෙවීමකදීම යම් නිශ්චිත මුදලක් අතරඳවුම් ලෙස දෝෂ වගකීම් කාලසීමාව අවසන් වන තුරු රඳවාගත යුතු වුවද, කිසිදු රඳවුම් මුදලක් රඳවාගැනීමකින් තොරව ගිවිසුම්ගත මුළු කොන්ත්‍රාත් මුදලම නිදහස් කර තිබුණි. 5.4.8 මාර්ගෝපදේශය අනුව රු. 29,775,000 ක්වූ ඇස්තමේන්තුගත වටිනාකමට අදාළව කාර්යසාධන සුරක්ෂණයක් ලබාගෙන නොතිබුණි.

(ii) ගිවිසුම් ප්‍රකාරව කොන්ත්‍රාත්තුවේ වැඩ 2024 දෙසැම්බර් 31 දින වන විට නිම කළ යුතු වුවත්, කොන්ත්‍රාත් කාලය අවසන් වී මාස 03 කට වැඩි කාලයක් ගත වී තිබුණද වැඩ අවසන් කර නොතිබුණි.

(iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 138 රෙගුලාසිය ප්‍රකාරව සහතික කිරීමකින් තොරව රු. 23,638,972 ක් ගෙවීම් කර තිබුණි.

(iv) භෞතික පරීක්ෂාවේදී නිරීක්ෂණය කළ පරිදි ප්‍රමාණ පත්‍රයේ C – 3 වැඩ විෂය යටතේ සන මීටර් 6.7 ක් මිලිමීටර් 225 x 225 කයිරු තලාදාය ඉදිකිරීමේදී (Plinth beam) ඉතාමත් දුර්වල ප්‍රමිතියෙන් යුතුව ඉදිකරමින් පැවතුණු අතර ප්‍රමාණ පත්‍රයේ D – 1 වැඩ විෂය යටතේ සනමීටර් 175 කින් යුතු අත්තිවාරමේ කළුගල් බැම්ම කළුගල් අතර හිඳැස් පවතින පරිදි සකස් කර බදාම තැවරීමකින් තොරව ඉතාමත් දුර්වල මට්ටමෙන් නියමිත ප්‍රමිතියෙන් බැහැරව ඉදිකරමින් පැවතිණි.

4.2 වත්කම් කළමනාකරණය

(අ) උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් ගොඩනැගිල්ල සඳහා GSW 80 P මාදිලියේ ජෙනරේටරයක් සවි කර තිබුණු නමුත් එය සවි කළ දින සිට වසර 02 කට වැඩි කාලයක් නිෂ්කාර්යව පැවති අතර සේවා කිරීම වෙනුවෙන් වාර්ෂිකව රු. 115,404 ක මුදලක් ගෙවා තිබුණි.

(ආ) උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් III ශ්‍රේණියේ ලිපිකරු රජයේ නිවාසය 2022 වර්ෂයේ සිට වසර 03 කට ආසන්න කාලයක් නිෂ්කාර්යවද, මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිල පියස නිල නිවාස සංකීර්ණයේ පවතින එක් නිවසක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට වසර 05 කට ආසන්න කාලයක් ඌන උපයෝජිතවද පැවතුණි.

4.3 පාඩු හා හානි

උඩදුම්බර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් සංචිත කැබ් රථය 2024 අගෝස්තු 12 දින අනතුරට පත්වීමෙන් වාහනය අලුත්වැඩියා කිරීම වෙනුවෙන් දැරීමට සිදු වූ රු.601,500 ක මුදලින් අදාළ රක්ෂණ සමාගමෙන් රු. 565,000 ක මුදලක් ගෙවා තිබුණද රක්ෂණ සමාගමෙන් ප්‍රතිපූර්ණය නොකළ රු. 35,700 ක රජයට සිදු වූ අලාභය සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

4.4 කළමනාකරණ දුර්වලතා

(අ) මහනුවර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 19 ක විශ්‍රාමිකයන් 194 දෙනෙකු වෙත වර්ෂ 01 ත් වර්ෂ 05 ත් අතර කාල පරාසයක් තුළ රු. 43,891,319 දෙනෙකු විශ්‍රාම වැටුප් වැඩිපුර ගෙවා තිබුණු අතර ඉන් රු. 21,657,553 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් අය කර නොතිබුණි.

(ආ) 2023 හා 2024 වර්ෂවලදී ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක විශ්‍රාමිකයින් සඳහා විදෙස්ගත විශ්‍රාමිකයින්ට ජීවන වියදම් දීමනාව හා විශේෂ දීමනාව ලෙස විශ්‍රාමිකයන් 35 කට රු. 367,270 ක මුදලක් වැඩියෙන්ද විදෙස්ගත විශ්‍රාමිකයන් 50 කුට රු. 696,412 ක් අඩුවෙන්ද ගෙවා තිබුණි.

(ඇ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 14 කට අයත් ඉඩම් කොටස් 1790 ක් වසර 01 සිට වසර 27 ක කාලයක් ගත වී ඇතත් අත්පත් කර ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 15 ක ඉඩම් කොටස් 542 ක් වසර 01 ත් වසර 15 ත් අතර කාලයක් ගත වී තිබුණද, පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ඉ) මහනුවර දිස්ත්‍රික්කයේ නාය යෑම් අධි අවදානම් තත්ත්වයන් ලෙස ප්‍රාදේශීය ලේකම් කාර්යාල 17 ක පවුල් 1,539 ක් හඳුනාගෙන තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විට ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ක පවුල් 259 ක් පමණක් නැවත පදිංචි කිරීම සිදු කර තිබුණි. පවුල් 219 ක් විකල්ප අවස්ථා අනුව පදිංචිය සඳහා යොමු වී තිබුණු අතර තව දුරටත් පවුල් 1,319 ක් අධි අවදානම් ප්‍රදේශයේම පදිංචි වී සිටින බව නිරීක්ෂණය විය.

(ඊ) 2008 ග්‍රාම සංවර්ධන සමිති ව්‍යවස්ථාව අනුව වසර 02 කට වරක් ප්‍රතිසංවිධානය නොකිරීම හේතුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ග්‍රාම සංවර්ධන සමිති 360 කින් 123 ක ලියාපදිංචිය අහෝසි වී අක්‍රීය තත්ත්වයේ පැවතුණි.

(උ) 2013 ඔක්තෝබර් 07 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 2(ආ) ඡේදය අනුව නිවාඩු දින රාජකාරී කිරීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක නිලධාරීන් 13 දෙනෙකු දින 118 ක් සඳහා නිවාඩු දින සේවය කිරීමෙන් පසු ආවරණ අනුමැතිය ලබා ගෙන තිබුණි.

(ඌ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 12 ක ඉඩම් කැබලි 53 ක වන්දි මුදල් ගෙවීම් හා අත්පත් කර ගැනීමට අනුමැතිය ලද දින හා ප්‍රතිපාදන මුදල් ගෙවූ දින අතර මාස 02 සිට වර්ෂ 22 දක්වා ප්‍රමාදවීම් හේතුවෙන් අත්පත් කර ගැනීමට අදාළ රු. 259,985,297 ක් වූ වන්දි මුදලට අමතරව ඉඩම් කැබලි 36 ක් සඳහා රු. 167,241,969 ක පොලී මුදලක්ද ගෙවීම් කර තිබුණි.

(එ) වළල ඒ රත්නායක විදුහලේ රැදවුම් බැම්ම ඉදිකිරීමට අදාළව නව ඇස්තමේන්තුවක් සකස් කර අනුමත කර ගැනීමකින් තොරව පැති බැම්මේ වෙනස්වීම් (ඇලවීම) යථාවත් කිරීම වෙනුවෙන් 2024 දෙසැම්බර් 31 දින ලියන ලද රු. 4,776,216 ක් වටිනා චෙක්පත විගණිත අවස්ථාව වන 2025 අප්‍රේල් 08 දින දක්වා මාස 03 කට අධික කාලයක් අත රඳවා ගෙන තිබුණි.

(ඒ) 2024 මාර්තු 28 දිනැති අංක 06/2024 දරන ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛය අනුව සංවර්ධන ව්‍යාපෘති ඉටු කිරීම වෙනුවෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක ප්‍රාදේශීය ලේකම්වරුන්ට මසකට රු. 15,000 බැගින් 2024 වර්ෂයට දීමනාවක් ගෙවා තිබුණි. එසේ නිබියදී 2014 ජනවාරි 31 දිනැති අංක ESI/8/Allowance/03/121 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ ලිපිය අනුව ග්‍රාමීය මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමෙන් සම්බන්ධීකරණය කරමින් මනා වියදම් කළමනාකරණයකින් හා අධීක්ෂණයකින් යුතුව නියමිත කාලය තුළ නිම කිරීම සඳහා මෙම ප්‍රාදේශීය ලේකම්වරුන්ට මාසිකව රු. 5,000 බැගින් රු. 250,000 ක දීමනාවක්ද ගෙවා තිබුණි.

(ඔ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv පරිච්ඡේදයේ 4.5 හා 4.6 වගන්තිවල නියමයන්ගෙන් බැහැරව සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනෙකු වෙත ලබා දී තිබුණු රු. 196,661 ක ණය ශේෂ නිරවුල් කර නොතිබුණි.

5 යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටු කිරීම

(අ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 11 ක වැඩිහිටි දීමනා වශයෙන් ප්‍රතිලාභීන් 6,534 ක් සඳහා රු. 22,554,400 ක මුදලක්ද, ආබාධිත දීමනා වශයෙන් ප්‍රතිලාභීන් 802 ක් සඳහා රු. 6,015,000 මුදලක්ද, වකුගඩු දීමනා වශයෙන් ප්‍රතිලාභීන් 179 ක් සඳහා රු. 1,342,500 ක මුදලක්ද 2024 දෙසැම්බර් 31 දින වන විට ගෙවිය යුතුව පැවතුණි.

(ආ) 1968 අංක 32 දරන පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ පනත හා 2016 අංක 08 දරන පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනතේ 5.2 වගන්තිය අනුව වයස අවුරුදු 15 ට වැඩි සෑම පුද්ගලයෙකු සඳහාම ජාතික හැඳුනුම්පතක් නිකුත් කළ යුතු වුවද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 18 ක වයස අවුරුදු 15 ත් 40 ත් අතර පුද්ගලයින් 59 ක්, වයස අවුරුදු 41 ත් 60 ත් අතර පුද්ගලයින් 249 ක්, වයස අවුරුදු 61 ට වැඩි පුද්ගලයින් 508 ක් හා ආබාධිත පුද්ගලයින් 50 ක් වශයෙන් පුද්ගලයින් 866 ක් වෙත 2024 දෙසැම්බර් 31 දින වන විටත් හැඳුනුම්පත් නිකුත් කර නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

6.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය

(අ) මහනුවර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 හි 2024 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය හා සැසඳීමේදී පුරප්පාඩු 359 ක් හා සංවර්ධන නිලධාරී තනතුරෙහි අතිරික්ත 322 ක් පැවතුණි. විස්තර පහත දැක්වේ.

තනතුරු වර්ගය	අනුමත කාර්ය මණ්ඩලය	තත්‍ය කාර්ය මණ්ඩලය	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්ත සංඛ්‍යාව
i. ජ්‍යෙෂ්ඨ	112	84	28	
ii. තෘතීයික	83	61	22	
iii. ද්විතීයික	3,469	3,492	299	322
iv. ප්‍රාථමික	218	208	10	
	3,882	3,845	359	322

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල 02 ක නිලධාරීන් 10 දෙනෙකු වාර්ෂික සමාලෝචන වාර්තා හා නිවාඩු වාර්තා නොලැබීම සහ සේවය ස්ථිර කිරීමට අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට ප්‍රමාද වීම හේතුවෙන් සේවය ස්ථිර කර නොතිබුණි.

(ඇ) 2009 පෙබරවාරි 20 දිනැති අංක 1539/30 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති කාණ්ඩ අංක 01 හි VII වැනි පරිච්ඡේදයේ රාජ්‍ය නිලධාරීන් ස්ථාන මාරු කිරීම සම්බන්ධව විධිවිධාන හා 2001 ඔක්තෝබර් 23 දිනැති අංක 18/2001 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුව රාජ්‍ය නිලධාරීන් ස්ථාන මාරුවීමේ අවශ්‍යතාවය පෙන්වා දී තිබුණද, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 10 ක නිලධාරීන් 298 ක් වසර 05 සිට වසර 24 දක්වා කාලයක් එකම ස්ථානයේ සේවය කර තිබුණි.

එම්.කේ.ඩී.එන්.මායාකඩුව
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

පිටපත ;- අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 01.

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

4.1.1. ක්‍රමසම්පාදන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දිස්ත්‍රික් ක්‍රියාත්මක සැලැස්ම	100%		
විමධ්‍යගත ආයෝජන වැඩසටහන	99%		
ජනාධිපති කාර් යාල - විශේෂ බලපත්‍ර වැඩසටහන	75%	ජනාධිපති හා පා ර් ලිමේන්තු මැතිවරණ ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම	
කඳුකර දශකය වැඩසටහන	98%		
ග්‍රාමීය මාර් ග සංව ර් ධන වැඩසටහන	65%	ජනාධිපති හා පා ර් ලිමේන්තු මැතිවරණ ප්‍රකාශයට පත් කිරීම හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම	
ක්‍රීඩාපිටි සංවර්ධන වැඩසටහන	100%		
ක්‍රීඩාපිටි සංවර්ධන වැඩසටහන (පැති විකට්)	94%		
වලල ඒ රත්නායක මධ්‍ය මහා විද්‍යාලය - ක්‍රීඩාගාරය ඉදි කිරීම	100%		
වලල ඒ රත්නායක මධ්‍ය මහා විද්‍යාලය - ධාවන පථය ඉදි කිරීම	100%		
වලල ඒ රත්නායක මධ්‍ය මහා විද්‍යාලය - රැඳවුම් බැම්ම ඉදි කිරීම	100%		
දිස්ත්‍රික් ක්‍රමසම්පාදන කාර්යාලය හරහා ක්‍රියාත්මක වැඩසටහන්වලට අදාල ප්‍රගති සමාලෝචනය	100%		
දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගණන	58%	ජනාධිපති හා පාර්ලිමේන්තු මැතිවරණ ප්‍රකාශයට පත් කිරීම	
මහජන පැමිණිලි, ජනාධිපති කාර්යාලයෙන් හා අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ලැබෙන ලිපි වලට ක්‍රියාත්මක වීම	100%		
වෙනත් විශේෂ වැඩසටහන් සංවිධානය හා සහභාගී වීම	100%		
ග්‍රාම ශක්ති වැඩසටහන	91%		
සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන	100%		

4.1.2.දිස්ත්‍රික් ඉංජිනේරු අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් රජයේ නිල නිවාස හා දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ අත්‍යවශ්‍ය අළුත්වැඩියා කටයුතු	80%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල 20 යි කොන්ක්‍රීට් මාර්ගවල තත්ව පරීක්ෂණ කටයුතු සිදු කිරීම	100%		
දිස්ත්‍රික්කයෙහි තාක්ෂණික නිලධාරීන් සඳහා පුහුණු වැඩසටහන් සිදු කිරීම	0%		

4.1.3. ගිණුම් අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
2024 වර්ෂයට මූල්‍ය බලතල පැවරීම	100%		
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශන පිළියෙළ කිරීම	100%		
2024 වර්ෂය සඳහා වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම	100%		
වැටුප් ගනනය කිරීම සහ payroll පරිසණක වැඩසටහන මගින් වැටුප් පිළියෙළ කිරීම හා ගෙවීම	100%		
මාසික ඒකාබද්ධ ගිනුම් සාරාංශ පිළියෙළ කිරීම	100%		
පිලියෙළ කරන ලද මාසික බැංකු සැසඳුම් ප්‍රමාණය	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා අක් මුදල් නිදහස් කිරීම	100%		
ලියාපදිංචි කරන ලද සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල මූල්‍ය නොවන වත්කම් ගිණුම් ගත කිරීම	100%		
පිළිතුරු සපයන ලද බාහිර හා අභ්‍යන්තර විගණන විමසුම් ප්‍රමාණය	100%		
වෙනත් දෙපාර්තමේන්තු /අමාත්‍යාංශ වල ගෙවීම් කටයුතු	100%		
වත්කම් සත්‍යාක්ෂණය කිරීම	100%		
ප්‍රසම්පාදන තීර ණ ප්‍රමාණය	100%		
ප්‍රාදේශීය ලේකම් කාර්යාල වැඩි දියුණු කිරීම	100%		
ස්ථාන මාරු වී ගිය සහ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ නිරවුල් කිරීම හා ගිණුම් ගත කිරීම	100%		
ආදායම් රැස් කිරීමේ කටයුතු	100%		
ප්‍රතිපාදන කළමනාකරණය	100%		
පොදු තැන්පත් ගිණුමේ කටයුතු	100%		
වව්චර් පත් පරීක්ෂා කිරීමේ කටයුතු	100%		
සරප්ගේ රාජකාරි කටයුතු	100%		
අග්‍රිම පාලන කටයුතු	100%		
භාණ්ඩ මිලදී ගැනීමට අදාළ ගබඩා පාලනය	100%		
විශ්‍රාම වැටුප් පිලිබඳ කටයුතු	100%		

4.1.4.අභ්‍යන්තර විගණන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දිස්ත්‍රික් විගණන හා කළමණාකරණ කමිටු පැවැත්වීම	100%		
ප්‍රාදේශිය විගණන හා කළමණාකරණ කමිටු පැවැත්වීම	100%		
ගෙවා නිමි වවුවර්පත් පරීක්ෂා කිරීම	100%		
අභ්‍යන්තර විගණන වාර්තා සකස් කිරීම	100%		
විශේෂ විමර්ශන පැවැත්වීම	100%		
පුහුණු වැඩසටහන් පැවැත්වීම	100%		
අවදානම් ලේඛනය සකස් කිරීම	100%		
විගණන සැලැස්ම සකස් කිරීම	100%		
පොදු නිරීක්ෂණ නිකුත් කිරීම	100%		

4.1.5. සංවර්ධන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
රාජ්‍යපරිපාලන අමාත්‍යාංශ ප්‍රතිපාදන පුහුණු කිරීම	100%		
ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ප්‍රතිපාදන පුහුණු කිරීම	100%		
ආධ්‍රනික පුහුණුලාභීන් සඳහා සේවාරම්භක පුහුණු	100%		
වෙනත් අමාත්‍යාංශ ප්‍රතිපාදන	100%		
රාජ්‍ය නිලධාරීන් සම්බන්ධ විනය පාලනය	100%		
ජාතිකවැඩසටහන් ක්‍රියාත්මක කිරීම	100%		
හදිසි ආපදා තත්වයන් කළමනාකරණය	100%		
තොරතුරු දැනගැනීමේ පනතේ රජකාරී	100%		
මහනුවරදිස්ත්‍රික්කයේ ප්‍රවාහන ඒකාබද්ධ යාන්ත්‍රනය පවත්වා ගැනීම	මහා මාර් ග අමාත්‍යාංශය මගින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා නිලධාරියෙකු අනුයුක්ත කළ ද පසුව එම නිලධාරිණිය එකී අමාත්‍යාංශය මගින් ආපසු ගෙන්වා ගැනීම		
දිස්ත්‍රික්අබිං කමිටුව පැවැත්වීම හා බලපත්‍ර නිකුත් කිරීම	100%		
ප්‍රාදේශීයලේකම් කාර්යාල හා දිස්ත්‍රික් ලේකම් ර් යාලයේ අංශ අතර සම්බන්ධීකරණය			
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ පවතින සංචාරක බංගලාවෙන් කිරීමේ කටයුතු	100%		
විශේෂආපදා හානි වාර්තා කිරීම හා වන්දි ගෙවීම සම්බන්ධ කටයුතු			
වාර ෂිකවහදුනාගත් සේවා සැලසීමේ නිර් ණායක 05 ක කාර්ය සාධන ඉලක්කයන් සාක්සාත්කර ගැනීම සඳහාප්‍රාදේශීය කාර්යාල නියාමනය කරමින් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	100%		
කාර් ය සාධන වාර් තාව සකස් කිරීම	100%		
අස්වැසුම ප්‍රතිලාභීන් තෝරාගැනීම සම්බන්ධ කටයුතු ප්‍රාදේශීය ලේකම් කාර් යාල අතර සම්බන්ධීකරණය	100%		

4.1.6. ඉඩම් අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දෛනික තැපෑල	100%		
ආමාත්‍යාංශ මඟින් යොමු කර ඇති ඉඩම් ගැටළු	99%		
දැව හෙළීම්	160%		
ජල හා විදුලි ගැටළු	50%	වර්ෂය ආරම්භයේ ඉලක්ක කළද ලැබුණු ඉල්ලීම් මත පදනම්ව ප්‍රගතිය ගණනය කර ඇත.	
පරිසර කටයුතු පිළිබඳ කමිටු රැස්වීම්	75%		වර්ෂය ආරම්භයේ ඉලක්ක කළද ලැබුණු ඉල්ලීම් මත පදනම්ව ප්‍රගතිය ගණනය කර ඇත.
ඉඩම් ගැටළු සම්බන්ධ වෙනත් ඉල්ලීම්	277%		
දැව හෙළීම් සම්බන්ධ පරිසර කමිටු අනුමැතිය ලබා දීම	150%		
ගිනි අවි සම්බන්ධ රාජකාරී	96%		
නිල නිවාස සම්බන්ධ අලුත්වැඩියා කටයුතු	100%		

4.1.7. ජන හා සංඛ්‍යා ලේඛණ අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ශ්‍රී ලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - 2024 සමීක්ෂණය පැවැත්වීම	100%		
ශ්‍රීලංකාවේ ශ්‍රමබල සමීක්ෂණය - කේතකිරීම,සංස්කරණයහා පරිගණක ගත කිරීම (එක් එක් ප්‍රා. ලේ.කොට්ඨාශ භාර නිලධාරියා විසින් ඉටු කරනු ලබයි)	100%		
කාණ්ඩ 1 ඒ (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම - සතිපතා)	100%		
කාණ්ඩ 1 (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම - සති දෙක වරක්)	100%		
කාණ්ඩ 11 (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම - මසකට වරක්)	100%		
නිෂ්පාදකයාගේමිල -	100%		
කාණ්ඩ 111 (විවෘත වෙළඳපොල සිල්ලර මිල රැස්කිරීම - කාර්තුවකට වරක්)	100%		
වීඅස්වනු සමීක්ෂණය	100%		
වීවගාකළ බිම් ප්‍රමාණය පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම හා දිස්ත්‍රික්වාර්තාවසැකසීම	100%		
ගොඩහෝග පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීමහාදිස්ත්‍රික් වාර්තාවසැකසීම	100%		
මස්පිණිස මරනු ලබන සතුන් පිළිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම	100%		
ගොඩනැගිලිසංඛ්‍යාලේඛන එක්රැස් කිරීම	100%		
පලාත්පාලන සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම	100%		
වාර්ෂිකඉදිකිරීම් කර්මාන්ත සමීක්ෂණය	100%		
දැවසංඛ්‍යාලේඛන රැස් කිරීම	100%		
සංඛ්‍යානනිබන්ධනයසකස් කිරීම 2021	100%		
වාර්ෂිකකර්මාන්ත සමීක්ෂණය	100%		
වාර්ෂික	100%		
2024 ජන හා නිවාස සංගණනය	100%		
ගව කුකුළුආදි සතුන් පිලිබඳ සංඛ්‍යාලේඛන එක්රැස් කිරීම	100%		
කාලීනවදෙපාර්තමේන්තුව මගින් පවරනු ලබන විවිධ සංගණන හා සමීක්ෂණ පැවැත්වීම			
විවිධරාජ්‍ය සහ පුද්ගලික ආයතන, පර්යේෂණ සහ පුද්ගලික ආදී අවශ්‍යතා සඳහා අවශ්‍ය දත්තසකස්කිරීම, විශ්ලේෂණය සහ නිකුත් කිරීම	100%		

4.1.8.දිස්ත්‍රික් ආපදා කළමනාකරණ අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ආපදා අවම කිරිමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරිම	25%2023 වර්ෂයෙන් 2024 වර්ෂයේදි අවසන් කිරිමට අවිච්ඡේද කරන ලද ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කරන ලදි.(රු.මි.28)එක්ව්‍යාපෘතියක් සඳහා පමණක් ප්‍රතිපාදන ලැබිණි		
ආපදා කළමණාකරණ දැනුවත් කිරිමේ වැඩසටහන්	35%	මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම	
ආපදා පෙර සුදානම් සහ සැළසුම් සකස් කිරිමේ වැඩසටහන්	76.19%	මූල්‍ය ප්‍රතිපාදන නොලැබීම	
හදිසි ආපදා ප්‍රතිචාර දැක්වීමේ කටයුතු		100%	
මහජන පැමිණිලි පරික්ෂාව සහ ආදාල ආයතන සම්බන්ධීකරණ කටයුතු		80%	
ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතන හු පරික්ෂණ		100%	

4.1.9. ඉඩම් පරිහරණ සැලැසුම් අංශය (ඉඩම් පරිහරණ සැලසුම් දෙපාර්තමේන්තුව)

විශේෂිත දර්ශක		අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
		100% - 90%	75% - 89%	50% - 74%
ඉඩම් පරිහරණ දත්ත එකතු කිරීම, දත්ත හුවමාරුව හා ඉඩම් පරිහරණ සැලසුම්කරණය	1.1 ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය	භෞතික 100% මූල්‍ය 100%		
	1.2 භූමි පරිහරණ වෙනස්වීම් හඳුනාගැනීමේ සමීක්ෂණය	භෞතික 100% මූල්‍ය 100%		
පස හා ජල සංරක්ෂණය තුලින් ඌන පරිහරණ කෘෂිකාර්මික බිම්වල ඵලදායිතාවය ඉහල නැංවීම		භෞතික 100% මූල්‍ය 100%		
ග්‍රාමීය මට්ටමේ ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම		භෞතික 100% මූල්‍ය 100%		
ක්ෂුද්‍ර ජලපෝෂක සඳහා ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම		භෞතික 100% මූල්‍ය 100%		
සුවිශේෂී ඉඩම් පරිහරණ ගැටළු පාදක කර ගනිමින් සිදු කරනු ලබන විශේෂ අධ්‍යනය		භෞතික 100% මූල්‍ය 100%		
දිස්ත්‍රික් ඉඩම් පරිහරණ සැලසුම් කමිටු පැවැත්වීම		(මැතිවරණ පැවතීම හේතුවෙන්)		
ප්‍රාදේශිය ඉඩම් පරිහරණ සැලසුම් කම්ටු.				

4.1.10. ආගමික/බෞද්ධ කටයුතු සමායෝජක නිලධාරි

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
සිල් මාතා රැස්වීම් පැවැත්වීම	100%		
දහම් පාසල් පෙළ පොත් බෙදා දීම	100%		
දිස්ත්‍රික් සිසු නිපුණතා පැවැත්වීම	100%		
දහම් පාසල් ගුරු විභාග පැවැත්වීම	100%		
විහාරස්ථාන සංවර්ධන කටයුතු	100%		
ආදාහන ආධාර ලබා දීම	100%		
සාර ධර්ම වැඩසටහන් පැවැත්වීම	100%		
දහම් පාසල් ගුරු දීමනා ගෙවීම	100%		
දිස්ත්‍රික් ශාසනාරක්ෂක බල මණ්ඩල පැවැත්වීම	100%		

4.1.11. ආගමික කටයුතු හා භාෂා/සංවර්ධන නිලධාරි අංශය (හින්දුකටයුතු)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ඌන සංවර්ධිත හින්දු කෝවිල් ප්‍රතිසංස්කරණ, අලුත්වැඩියාව හා සංවර්ධන	100%		
ඌන සංවර්ධිත හින්දු දහම් පාසල් සඳහා උපකරණ ලබා දීම	100%		
හින්දු උත්සවය මුළු වැඩසටහන්	100%		
දහම් පාසල් ගුරු දීමනා	100%		
දත්ත තොරතුරු පද්ධතිය	100%		
දහම් පාසල් ගුරුවරුන් සඳහා දහම් අධ්‍යාපන වැඩසටහන	100%		
හින්දු දහම් පාසල් දරුවන් සඳහා වන ජාතික නිර්මාණ කුසලතා සම්මාන තරඟ පැවැත්වීම	100%		
හින්දු දහම් පාසල් ගුරුවරුන් සඳහා අවසාන ධර්මාචාර්ය සම්මන්ත්‍රණ පැවැත්වීම	100%		

4.1.12. ආගමික කටයුතු හා භාෂා/ සංවර්ධන නිලධාරි අංශය (ක්‍රිස්තියානි ආගමික කටයුතු)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දේවස්ථාන ප්‍රතිසංකරණය අලුත්වැඩියාව හා සංවර්ධන	100%		
ආගමික හා සංස්කෘතික සුරක්ෂිතතාවය පාස්කු / නත්තල් වැඩසටහන් ධර්ම ප්‍රභාෂ්වර කලාකරුවන් ඇගයීමේ වැඩසටහන / නත්තල් තැපැල් මුද්දර චිත්‍ර තරඟය	100%		
දහම් පාසල් ගුරුවරුන් සඳහා දහම් අධ්‍යාපන / ධර්මාචාර්ය ගෞරව විභාග සම්මන්ත්‍රණ	100%		
දහම් පාසල් ළමුන් සඳහා බයිබල් දැනුම මිනුම හා කථන තරඟ පැවැත්වීම	100%		
අධ්‍යාත්මික පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන් (පවුල් වැඩසටහන් සහ ගිහි වැඩසටහන්)	100%		
ජන සන්නිවේදන වැඩසටහන් (කිතුණු ගීතිකා හා කිතුණු කලා ශිල්ප)	100%		

1.13. ආගමික කටයුතු අංශය (මුස්ලිම් ආගමික)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
මුස්ලිම් ආගමික පල්ලි/ දහම් පාසල් සඳහා ආධාර, වැඩි දියුණු කිරීම්, අලුත්වැඩියා කටයුතු/ උපකරණ ලබාදීම.	100%		
මුස්ලිම් ආගමික උත්සව උදා:- මීලාත් නබි, රාමසාන්	100%		
මුස්ලිම් දහම් පාසල් ගුරුවරුන් සඳහා ගුරු පුහුණු වැඩසටහන්	100%		
මුස්ලිම් දහම් පාසල් ගුරුවරුන් සඳහා ගුරු දීමනාව ලබා දීම	100%		
මුස්ලිම් කලාකරුවන් සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	100%		
මුස්ලිම් තරුණ තරුණියන් සඳහා මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන් පැවැත්වීම	100%		
ආහාර සුරක්ෂිතා වැඩසටහන්	100%		
අන්තර් ආගමික සහජීවන වැඩසටහන්	100%		
මත්ද්‍රව්‍ය වැඩසටහන්	100%		

4.1.14. සංස්කෘතික කටයුතු අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
සර්වාගමික වැඩ සටහන	100%		
දිස්ත්‍රික් ජාතික නිදහස් දින සැමරුම් උත්සවය	100%		
රාජ්‍ය කලාභූෂණ සම්මාන ප්‍රදානය	100%		
අගහිඟ කලාකරු ආධාර ගෙවීම	100%		
කලායතන ආධාර	100%		
වාර්ෂික ඇසළ පෙරහැර මංගල්‍යය	100%		
සංහිදක සවිය	100%		

4.1.15. ජාතික ඒකාබද්ධතා ප්‍රවර්ධන සහකාර

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය පිළිබඳව රජයේ නිලධාරීන් දැනුවත් වූ රජයේ නිලධාරීන් සංඛ්‍යාව	100%		
ත්‍රෛභාෂා නාමපුවරු සකස් කරන ලද කාර්යාල ගණන	2024 වර්ෂයට ප්‍රතිපාදන ලබා දී නැත.		
ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සකසා ඇති භාෂා සැලසුම් සංඛ්‍යාව	100%		
පසු විපරම් කරන ලද මහනුවර දිස්ත්‍රික්කයේ නව්‍ය ආදර්ශ කාර්යාලගණන	100%		
ක්‍රියාත්මක කරන ලද පැය 100 දෙමළ භාෂා පාඨමාලා සංඛ්‍යාව හා සහභාගී වූ සංඛ්‍යාව	100%		
ක්‍රියාත්මක කරන ලද පැය 150 දෙමළ භාෂා පාඨමාලා සංඛ්‍යාව	100%		
පැය 200 දෙමළ සහ 100 හා 150 සිංහල භාෂා පාඨමාලා හැදෑරූ නිලධාරීන් සංඛ්‍යාව	පන්තියකට ප්‍රමාණවත් ඉල්ලීම් සංඛ්‍යාවක් ලැබී නැත. ලැබුණු ඉල්ලීම් online පාඨමාලා සඳහා DOL වෙත යොමු කර ඇත.		
ඉංග්‍රීසි භාෂා පාඨමාලාව හදාරන ලද කාන්තා නිලධාරිණියන් සංඛ්‍ය	88%American Corner ආයතනය හා එක්ව ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන සඳහා ඒ ඒ අවස්ථාවේ පවතින ඉඩ පහසුකම් අනුව නිලධාරීන් යොමු කෙරේ.		
රාජ්‍ය භාෂා දිනය හා සතියට සමගාමීව පාසල් දිනය සහ යොවුන් දිනය සැමරීමේ වැඩසටහන් සඳහන් සහභාගී වූ ළමුන් සංඛ්‍යාව	100%		
ජාතික භාෂා හා නවීන භාෂාවන්ගේ වැදගත්කම සම්බන්ධ විවෘත සංවාද පැවැත්වීම	ව්‍යාපෘති යෝජනාවන් යොමු කළද 2024 වර්ෂය සඳහා ප්‍රතිපාදන ලබා දිය නොහැකි බව දන්වා ඇත		

4.1.16. කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
ව්‍යවසායකත්ත්වය හාකලමනාකරණ සංවර්ධනය	100%		
තාක්ෂණයහා නව්‍යකරණය	100%		
අලෙවිකලමනාකරණය	100%		
මූල්‍යකළමනාකරනය හා සහය සේවා	100%		
ව්‍යාපාරඋපදේශනය හා පසු විපරම් කිරීම	100%		
පර්යේෂණ හා සංවර්ධනඅංශය	100%		

4.1.17.කිරුම් මිණුම් අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දිස්ත්‍රික්කය පුරා වෙළඳ ප්‍රජාවගේ කිරුම් මිනුම් උපකරණ සත්‍යෝක්ෂණය කොට මුද්‍රා තැබීමෙන් රජයට ආදායම් ලබා ගැනීම	104%		
වෙළඳාමේදී සිදුකරන අක්‍රමිකතා සොයා බැලීම හා අධිකරණයට ඉදිරිපත් කිරීම	123%		
දිස්ත්‍රික්කය තුල දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මඟින් දිස්ත්‍රික්කය තුළ මහජනයාට කිරුම් මිනුම් කටයුතු පිළිබඳ දැනුමක් ලබා දීම	1665%		

4.1.18. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
පසැල් ,පාරිභෝගික,වෙළඳ ආයතන දැනුවත් කිරීම්	100%		
මිල සමීක්ෂණ	100%		
පාරිභෝගික පැමිණිලි සංඛ්‍යාව	100%		
වැටලීම් ප්‍රමාණය	100%		

4.1.19. දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන අංශය (ශ්‍රී ලංකා කාන්තා කාර්යාංශය)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
නියාමනය නොකළ ක්ෂුද්‍ර මුළ්‍ය ණය ක්‍රමවලින් පීඩාවට පත් ග්‍රාමීය කාන්තාවන්ට සහන සැලසීමේ ස්වයං රැකියා ආධාර ප්‍රතිපාදන නිදහස් කිරීම.	100%		
විදේශගතවීමට අපේක්ෂිත කාන්තාවන් මෙරට දී සවිබල ගැන්වීම	100%		
ගෘහමූලික කාන්තාවන් සඳහා ස්වයං රැකියා ව්‍යාපෘතිය ආධාර ලබාදීම	100%		
ස්වාමියා බන්ධනාගාරගත වූ පවුල් සමාජ සවිබලගැන්වීම	100%		
අභාධ සහිත කාන්තාවන් බලගැන්වීම	100%		
දිරිය මංපෙත ව්‍යවසායක කාන්තාවන් බලගැන්වීම	100%		
ජාත්‍යන්තර කාන්තා දිනයට සමගාමී ව්‍යවසායක කාන්තා ඇඟයීම	100%		
ස්ත්‍රී පුරුෂ සමාජභාවය මත පදනම්වන හිංසනයන් ගෙන් වින්දිතභාවයට පත්වන කාන්තාවන් හා ළමුන්වෙනුවෙන් සේවා සැබයීමේ ඒකාබද්ධ යාන්ත්‍රණය පිළිබඳ පුහුනු වැඩසටහන්	100%		
ස්ත්‍රී පුරුෂ සමාජභායට ,මත සිදුවන හිංසනයන්ගේන් පිඩාවට පත්වනවින්දිතයින්සඳහාසේවා සැපයීමේ දී අවශ්‍යවන හදිසි කළමණාකරණ පිරිවැය දැරීම .	100%		
සයිබර් අපරාධ ප්‍රචණ්ඩත්වය වැලක්වීම පිලිබඳ රාජ්‍ය නිලධාරින් දැනුවත් කිරීම වැඩසටහන	100%		
දේශපාලනයටකාන්තාවන්ගේ දැයකත්වය පුළුල් කිරීම	100%		
නව තාක්ෂනිකමෙවලම් භාවිතය පිළිබඳ දැනුම ලබාදීම	100%		
දිස්ත්‍රික් වනිතා සංවර්ධන ප්‍රගති සමාලෝචන රැස්වීම්	100%	මැතිවරණය පැවත්වීමට නියමිත වූ කාලය තුල නිලධාරින් කැදවීමට නොහැකිවීම හා ශාලා පහසුකම් නොමැති කම	

4.1.20. දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන අංශය (මුල් ළමාවිය සංවර්ධන)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
‘‘උත්තම පූජා’’ ගැබිණි මව්වරුන්ගේ පෝෂණ දීමනාව ලබා දීමේ වැඩසටහන	100%		
පෙර පාසල් දරුවන් සඳහා උදැසන ආහාර ලබා දීමේ	100/%		

වැඩසටහන			
“ගුරු අභිමාණි ” පෙර පාසල් ගුරුවරුන් සඳහා මාසික දීමනාවක් ලබා දීමේ වැඩසටහන	100%		
පෙර පාසල් ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් පැවැත්වීම	100%		
සෞඛ්‍ය ප්‍රවර්ධන පෙර පාසල් ඇති කිරීම	100%		
මුල් ළමාවිය සංවර්ධන නිලධාරීන්ගේ ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.	100%		

4.1.21. දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන අංශය (ජාතික ළමාරක්ෂක අධිකාරිය)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
කැපකරු දෙගුරු අධ්‍යාපන ආධාර ලබා දුන් අඩු ආධායම්ලාභී පවුල් වල දරුවන් සංඛ්‍යාව	100%		
පාසල් නොයන ළමුන් පාසල්ගත කර අධ්‍යාපන උපකරණ ලබා දුන් ළමුන් සංඛ්‍යාව	95%අපේක්ෂිත ප්‍රමාණයට දරුවන්හමු නොවීම		
වෛද්‍ය ,පෝෂණ,හදිසි විපත්,නිවුන්දරු ආදී විවිධ ආධාර ලබා දුන් ළමුන් සංඛ්‍යාව	100%		
අගය කල යුතු දරුවකු වන්නේ කෙසේද යන්න දැනුවත් වූ ළමුන් සංඛ්‍යාව	100%		
අවදානම් පවුල් සඳහා ආරක්ෂණ සැලසුම්ක්‍රියාත්මක කල ව්‍යාපෘති සංඛ්‍යාව	95%යොමු කල සැළසුම් ප්‍රමාණයට මුදල් නොලැබීම		
අන්තර්ජාල අවභාවිතය තුල ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත් වූ සංඛ්‍යාව	100%		
ලෝක ළමා දිනය සැමරීම	100%		
ආන්තික ප්‍රජාව වෙනුවෙන් ක්‍රියාත්මක කරන වැඩසටහන් සංඛ්‍යාව	100%		
ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රජාව දැනුවත් කල වැඩසටහන් සංඛ්‍යාව	100%		
දිස්ත්‍රික් ළමා සභා රැස්වීම්/වැඩසටහන් ගනන	66% දිස්ත්‍රික් නිළධාරියකු නොසිටීම		
ප්‍රාදේශීය ළමා සභා රැස්වීම්/වැඩසටහන් ගනන	98%		
දිස්ත්‍රික් ළමා සංවර්ධන කමිටු රැස්වීම් ගනන	100%		
ප්‍රාදේශීය ළමා සංවර්ධන කමිටු රැස්වීම් ගනන	98%		
ළමා හිමිකම් ප්‍රවර්ධන නිළධාරීන්ගේ මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම	80% දිස්ත්‍රික් නිළධාරියකු නොසිටීම		

4.1.22. දිස්ත්‍රික් ළමා හා කාන්තා සංවර්ධන අංශය (ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරි)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
ළමා අපයෝජන සම්බන්ධ 1929 පැමිණිලි සහ පොදු පැමිණිලි විමර්ශනය සහ මනෝ සමාජීය සහය ලබා දීම	100%		
පාසල් ළමුන් ප්‍රවාහනය කරන සේවයකින් ළමා ආරක්ෂාව සම්බන්ධව දැනුවත් කිරීම	100%		
ළමා ආරක්ෂණ හා හිතකාමී ස්වේච්ඡා බලකායක් ඇති කිරීම	100%		
ශිෂ්‍ය තානාපති ජාතික වැඩසටහන	100%		
ළමා ආරක්ෂාව අදාළ නීතිමය ක්‍රියාවලිය පිළිබඳ රාජ්‍ය	100%		

සේවකයන් දැනුවත් කිරීම			
වතු ආශ්‍රිතව දරුවන්ගේ රැකවරණය තහවුරු කිරීමේ වැඩසටහන	100%		
අධීක්ෂණ වැඩසටහන් (ළමා සංවර්ධන මධ්‍යස්ථානය)	100%		
පාසල් ළමා ආරක්ෂක කමිටු අධික්ෂණය	100%		
දින සැමරුම් වැඩසටහන්	100%		
ළමා සංවර්ධන මධ්‍යස්ථාන ආශ්‍රිත මනෝ සමාජීය වැඩසටහන් පැවැත්වීම	100%		
අනාරක්ෂිතත,වින්දන,ආන්තික දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම	100%		
මාසික ප්‍රගති සමාලෝචන රැස්වීම	89%	ප්‍රතිපාදන ගැටළු	
ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් සමාජයේ විවිධ පාර්ශව දැනුවත් කිරීම.	100%ප්‍රතිලාභීන් 17536කි		

4.1.23. මානව සම්පත් අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
9 වසර පාසල් සිසුන් සඳහා බාණ්ඩ විෂයන් තෝරා ගැනීම	40%විෂය නිර්දේශ වෙනස්වන බව අධ්‍යාපන දෙපාර්තමේන්තුව දන්වා තිබුණු බැවින් සමහර පාසල් වලින් වැඩසටහන් සඳහා අවසර නොදීම		
වෘත්තිය මාර්ගෝපදේශන සා/පෙළ	65% යොදාගත් දිනයන් පාසලේ හදිසි අවශ්‍යතාවයන් මත වෙනස්වීම		
වෘත්තිය මාර්ගෝපදේශන උ/පෙළ	79% යොදාගත් දිනයන් පාසලේ හදිසි අවශ්‍යතාවයන් මත වෙනස් වීම		
රැකියාගත කිරීම	82% ආයතන වල පැවැති පුරප්පාඩු අවම වීම, ආයතනවල පවතින සමහර රැකියා අවස්ථාවන් ප්‍රතිලාභීන් ප්‍රතික්ෂේප කිරීම		
රැකියා අපේක්ෂිතයින් දැනුවත් කිරීමේ වැඩසටහන	100%		
ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු වැඩසටහන්	102%		
ප්‍රාදේශිය රැකියාපොල වැඩසටහන්	100%		
දිස්ත්‍රික් රැකියාපොල හා වෘත්තිය වැඩසටහන්	100%		
වෘත්තිය මාර්ගෝපදේශන සේවා සැපයීම	101%		
සෘජු රැකියා සඳහා යොමු කිරීම	100%		
වෘත්තිය කාර්ය සාධනය සඳහා යොමු කිරීම	138%		
රැකියා අපේක්ෂිතයින් ලියාපදිංචි කිරීම	105%		
රැකියා ඇබෑර්තු ලියාපදිංචි කිරීම	175%		
ව්‍යවසායකයින් හා ස්වයංරැකියාලාභීන් බිහි කිරීම	110%		
ගුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන	අවශ්‍යතාවය මත වැඩසටහන් පැවැත්වීම (ප්‍රතිපාදන නොමැතිව)		
ඩිජිටල් අලෙවිකරණ වැඩසටහන	100%		
නිලධාරීන් පුහුණුව	අවශ්‍යතාවය මත වැඩසටහන් පැවැත්වීම (ප්‍රතිපාදන නොමැතිව)		
නායකත්ව පුහුණුව	අවශ්‍යතාවය මත වැඩසටහන් පැවැත්වීම (ප්‍රතිපාදන නොමැතිව)		

4.1.24. විදේශ රැකියා අංශය - සංවර්ධන නිලධාරි

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
විගමනික ප්‍රජාව හඳුනාගැනීම හා දත්ත එකතු කිරීම	100%		
නැවත පැමිණි ශ්‍රමිකයන් සමාජගත කිරීම (ප්‍රත්‍යානුකලනය)	100%		
ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම	100%		
විගමනික ශ්‍රමික කමිටු පිහිටුවීම (ග්‍රාමීය)	120%		

4.1.25. ආයතන අංශය

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැයුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැයුම්		
	100% - 90%	75% - 89%	50% - 74%
දෛනික තැපෑල සම්බන්ධ කටයුතු	100%		
නිලධාරින් අනුයුක්ත කිරීම	100%		
රාජකාරි පැවරීම	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වාහන සම්බන්ධ සියළු කටයුතු	100%		
ප්‍රාදේශියලේකම්කාර්යාලවලවාහනසම්බන්ධදිස්ත්‍රික් ලේකම් තුමාට බලය පැවරූ ආයතන කටයුතු	100%		
වාහන සම්බන්ධ වෙනත් කටයුතු	100%		
දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය මාණ්ඩලික නිලධාරින්ගේ ආයතන කටයුතු	100%		
ප්‍රාදේශිය ලේකම්වරුන්ගේ ආයතන කටයුතු	100%		
ප්‍රාදේශිය ලේකම් කාර්යාලවල මාණ්ඩලික නිලධාරින්ගේ ආයතන කටයුතු	100%		
